දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / கோட்டை / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, **Fax**: 2784846

ඊමේල්.ඊ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. …………………………………

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**கல்வி அமைச்சு**

**Ministry of Education**

"ඉසුරුපාය" , ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
"இசுருபாயா" ஸ்ரீ ஜயவர்தனபுர
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. ED/01/44/01/1/In.C. … ……………………

දිනය / திகதி / Date 2012.11 ………………………………………

චක්‍රලේඛ අංක : 4/2013

සියලුම පීඨාධිපතිවරුන්
සියලුම ගුරුවිද්‍යාල විදුහල්පතිවරුන්
සියලුම ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්

**<u>ගුරු අධ්‍යාපන ආයතනවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා වන ඇගයීම් වැඩපිළිවෙළ</u>**

අධ්‍යාපන අමාත්‍යංශයේ කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව මේ වන විට දිවයිනේ සියලුම පාසල්වල හා කලාප අධ්‍යාපන කාර්යාලවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා ඇගයීම් ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත.

**02.** මීට සමගාමීව සියලුම ගුරු අධ්‍යාපන ආයතනවල ද ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා ප්‍රමිතීන්, දර්ශක හා නිර්ණායක හඳුන්වාදෙමින් එම ආයතනයන් තුළ ස්වයං ඇගයීම් ක්‍රමවේදයක් හඳුන්වාදීමට මෙන්ම බාහිර වශයෙන් ඇගයීමට ලක් කිරීමට සැලසුම් කර ඇත.

**03.** මේ සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර **05** යටතේ ගුරු අධ්‍යාපන ආයතනවල කෙරෙන කටයුතු ඇගයීම සඳහා නිර්ණායක සකස් කර ඇත.

1. ආයතන කළමනාකරණය
2. භෞතික සම්පත් කළමනාකරණය
3. මානව සම්පත් කළමනාකරණය
4. විෂය සමගාමී හා සුබසාධන කටයුතු
5. විෂයමාලා කළමනාකරණය හා පන්ති ඇගයීම

**04.** සකස් කරන ලද නිර්ණායක මගින් තම ආයතනය තුළ අභ්‍යන්තර ඇගයීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම ගුරු අධ්‍යාපන ආයතන ප්‍රධානීන්ගේ අවධානය යොමු කරවන අතර පහත සඳහන් කරුණු ඔස්සේ අභ්‍යන්තර කටයුතු සංවිධානය කළ යුතුවේ.

1. අභ්‍යන්තර ඇගයීම් කමිටුවක් ස්ථාපනය කිරීම.
2. ඇගයීමට ලක්කළ යුතු ක්ෂේත්‍ර හා දර්ශක පදනම් කරගත් සරල ඇගයීම් සැලැස්මක් සැකසීම හා මේ සම්බන්ධව ආයතනික ප්‍රජාව දැනුවත් කිරීම.
3. තේමා **05** සඳහා කමිටු **05**ක් පත් කිරීම.
4. වසරකට දෙවරක් එම කමිටු මගින් ඒ ඒ තේමා යටතේ ආයතනයේ කටයුතු අභ්‍යන්තර ඇගයීමකට ලක් කිරීම.
5. ඇගයීම් වාර්තා සකස් කොට අදාළ අංශ දැනුවත් කිරීම හා වාර්තා ගොනු කොට තබාගැනීම.
6. ඇගයීම් දිනයෙන් මාස දෙකකට පසු ප්‍රතිපෝෂණ වැඩසටහන් පැවැත්වීම.
7. තත්ව කව පිහිටුවීම හා ප්‍රගතිය වාර්තා කිරීම.

05. අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යාපීඨ ශාඛාවේ හා ගුරු විද්‍යාල ශාඛාවේ නිලධාරීන් විසින් ගුරු අධ්‍යාපන ආයතන බාහිර ඇගයීමට ලක්කොට එම ආයතනවල ප්‍රබලතා හා ගැටලු හඳුනාගැනීමටත් නිගමනවලට එළඹී අවශ්‍ය විසඳුම් ක්‍රියාත්මක කිරීමටත් මග පෙන්වනු ඇත.

එස්.එම්. ගෝඨාභය ජයරත්න
අධ්‍යාපන ලේකම්

පිටපත් ඃ

1. ගරු අධ්‍යාපන අමාත්‍යතුමා - දැ.ගැ.ස.
2. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා - දැ.ගැ.ස.
3. අතිරේක ලේකම්වරු - දැ.ගැ.ස.
4. විද්‍යාපීඨ කොමසාරිස් - දැ.ගැ.ස.